**මන්මුනේ බටහිර ප්‍රාදේශීය සභාව**

**--------------------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 මතය**

**-------**

මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මන්මුනේ බටහිර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------------**

**1.3.1 නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**------------------------------------------------------**

1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති X වන පරිච්ඡේදයේ 193 වගන්තිය පරිදි වර්ෂයේ තථ්‍ය ආදායම සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අය වැය ලේඛනය සමග සසඳා බලා විෂමතාවලට අදාල හේතු සහ විස්තර ඇතුලත් ප්‍රකාශනයක් සකස් කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබිණ.

**2. මූල්‍ය සමාලෝචනය**

**--------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

**--------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.8,064,362 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.3,170,306 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,894,056 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

**2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**--------------------------------------------**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, සමුච්චිත හිඟය**

**------------------------------------------------------------------------**

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචන වර්ෂයේ ආදායම තථ්‍ය ආදායම සහ සමුච්චිත හිඟය යනාදිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් වර්ගය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| බදුකුලිය | 2,417,247 | 2,629,182 | 90,564 |
| දඩ මුදල් | 2,023,825 | 2,071,615 | 259,655 |
| වෙනත් ආදායම් | 395,865 | 168,071 | 253,143 |

### 2.2 2 වරිපනම් සහ බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය පරිදි ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පිහිටි ඉඩම් සහ ඉදි කර ඇති නිවාස ගොඩනැගිලි යනාදිය සඳහා වරිපනම් අය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබූ බැවින් ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන මෙම වරිපනම් බදු මුදල් වශයෙන් ලැබිය යුතු ප්‍රමාණය ආසන්න වශයෙන් රු. 200, 000 ක මුදලක් සභාව වාර්ෂිකව අහිමි කරගෙන තිබුණි.

## 3. යහ පාලනය සහ ගිණුම් කටයුතුභාවය

### 3.1 අය වැය පාලනය

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 3% සිට 97% දක්වා විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) අය වැය පාලනය

(ඇ) ආදායම් කළමනාකරණය